CPA

CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# බන්ධනාගාර කළමනාකරණ සහ සිරකරු පුනරුත්තාපන රාජ්‍ය ඇමතිවරයාට එරෙහි චෝදනා පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය

2021 සැප්තැම්බර් 15, කොළඹ, ශ්‍රී ලංකාව: බන්ධනාගාර කළමනාකරණ සහ සිරකරු පුනරුත්තාපන රාජ්‍ය ඇමති ලොහාන් රත්වත්තේ, ඔහුගේ තනතුර අවභාවිත කරමින්, බීමත්ව, බන්ධනාගාර දෙකකට ඇතුළු වී රිමාන්ඩ් සිරකරුවන්ට පහර දීමට සැරසුණු බවට වූ සිද්ධි දෙකක් පිළිබඳව මෙම සතියේ ලැබුණු මාධ්‍ය වාර්තා, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ දැඩි කම්පනයට හේතු වෙයි. සැප්තැම්බර් 12 දා, සඳුදා, මිතුරන් කණ්ඩායමක් සමග රාජ්‍ය ඇමතිවරයා වැලිකඩ බන්ධනාගාරයට ඇතුළු වූ බව වාර්තා විය. ඉන් පසුව ඔහු හෙලිකොප්ටරයකින් අනුරාධපුරය බලා ගොස් අනුරාධපුර බන්ධනාගාරයට ඇතුළු වී සිරකරුවන් දෙදෙනකුට ගිනි අවියක් එල්ල කොට තමන් ඉදිරියේ දණ ගසන්නට නියෝග කළ බව වාර්තා වී ඇත. පෞද්ගලික තෘප්තිය සඳහා දේශපාලන තනතුර විදහා දැක්වීමේ භයානක ප්‍රවනතාවත්, සිරකරුවන්ගේ අයිතීන්ට සහ මානව ගරුත්වයට අසංවේදී බව සහ නොතකා හැරීමත්, පුද්ගලයින්ට තර්ජනය සඳහා ආයුධ භාවිතය සහ ශ්‍රී ලංකාවේ නීතියේ පාලනයට අවමන් කිරීමත්, මෙම සිදුවීම් දෙක ම මගින් පිළිබිඹු කරයි. මෙම සිදුවීම්වල බරපතළ තත්ත්වය සැලකිල්ලට ගනිමින්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉල්ලා සිටින්නේ, සිද්ධිය සම්බන්ධයෙන් පිළිගත හැකි පරීක්ෂණයක් ආරම්භ කිරීමට බලධාරීන්ට ඉඩ ලැබෙන සහ බියෙන් සහ පක්ෂපාතීත්වයෙන් තොරව ක්‍රියා කිරීමට ඉඩ සැලසෙන පරිදි, රාජ්‍ය ඇමතිවරයා වහා ම ඉල්ලා අස්විය යුතු බව යි.

වගවීම සම්බන්ධයෙන් කිසිදු දේශීය ක්‍රියාවලියක් දැනගන්නට නැති, සිරකරුවන්ගේ මරණවලට හේතු වූ බන්ධනාගාර කැරලි ගණනාවක් ඇතුළු මීට පෙර සිදු වූ ප්‍රචණ්ඩ සිදුවීම්වල පසුබිම යටතේ මෙම සිදුවීම් වූ බව ද, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සටහන් කරයි. ඔහුට සහ තවත් ගණනාවකට මිනීමැරුම් චෝදනා එල්ල වුව ද, පසුව නිදහස් කරනු ලැබූ, 2001 උඩතලවින්න මුස්ලිම් තරුණයින් දහ දෙනෙකු ඝාතනයට සම්බන්ධ බවට චෝදනා එල්ල වීම ඇතුළු රාජ්‍ය ඇමතිවරයා සම්බන්ධ අතීත ප්‍රචණ්ඩ සිදුවීම් මගින් මෙය වඩා ශක්තිමත් කරයි. මුක්තිය පිලිබඳ එබඳු පසුබිමක් තුළ, පරීක්ෂණ කිරීමට සහ අපරාධකරුවන් වගවීමට යටත් කිරීමට හැකිවන ස්වාධීන ක්‍රියාවලියක් යටපත් කළ හැකිවන ලෙස සාක්ෂි විකෘති කිරීම සහ සාක්ෂිකරුවන්ට තර්ජනය කිරීම ගැන සාධාරණ බියක් පවතී. සංකේතාත්මක සිදුවීම් ගණනාවක දී යුක්තිය ඉටුවීමේ පසුබැසීම් පිළිබඳව සහ ශ්‍රී ලංකාවේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයක හදිසි අවශ්‍යතාව ද මෙමගින් ප්‍රකාශ වෙයි.

මෙම සිද්ධීන් දෙක සිදුවන්නේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දැන් පැවැත්වෙන 48 වැනි සැසිවාරයේ දී, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වාර්තාව සාකච්ඡාවට ලක් වෙමින් පවතිද්දී ය. ඇත්තෙන් ම, සිද්ධීන් වන්නේ, මහා කොමසාරිස්වරියගේ වාචික යාවත්කාල කිරීමට ශ්‍රී ලංකා රජය ප්‍රතිචාර දක්වමින් ආණ්ඩුව් වගවීම, සන්හින්දියාව, මානව හිමිකම්, සාමය සහ තිරසාර සංවර්ධනය සම්බන්ධ සමස්ත පරාසයක ප්‍රශ්න සම්බන්ධයෙන් දැනෙන ක්‍රියාවලියක් ශාක්ෂාත් කර ගැනීමට කැප වී සිටින බව කියා සිටිද්දී ය. වෙනත් සිදුවීම් ගණනාවක් අතර, මෙම සිදුවීම් දෙක සම්බන්ධයෙන් වේගවත් සහ ස්ථිර පියවර ගැනීමට මෙම තීරනාත්මක අවස්ථාවේ නොහැකි වීම මගින් ලබාදෙන පැහැදිලි පණිවිඩය වනු ඇත්තේ, තමන්ගේ ම ප්‍රකාශ ක්‍රියාවට නැගීමට ශ්‍රී ලංකා ආණ්ඩුවට සැබෑ වුවමනාවක් නැති බව වන අතර ශ්‍රී ලංකාවේ පවතින මර්ධනකාරී පරිසරය සහ මුක්තිය පිළිබදව සාක්ෂිකරුවන්ගේ සහ සිවිල් සමාජයේ වාර්තා එමගින් වඩාත් ශක්තිමත් කරයි. මෙය සිදුවන්නේ, ශ්‍රී ලංකාවේ පිරිහෙමින් පවතින මානව හිමිකම් තත්ත්වය සහ මුල් බැස ගත් මුක්තිය සහ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයේ අඩංගු වටිනාකම් ශ්‍රී ලංකාව විසින් පවත්වාගෙන යනු ලැබීමේ අවශ්‍යතාවයත් පිළිබඳව තම සැලකිලිමත් බව ප්‍රකාශ කිරීමට එක්සත් ජාතීන්ගේ සාමාජික රටවලට සහ එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කාර්යාලයට අවස්ථාව සලස්වමින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට සහභාගී වීමේ අවස්ථාව සලසා ඇති එක්සත් ජාතීන්ගේ මහ සමුළු සැසිවාරය ආරම්භ වීමට දින කිහිපයක් තිබිය දී ය.